FACULTY OF GRADUATE STUDIES
RECEIVED
22 FEB 2013
UNIVERSITY OF KE...

# ශ්‍රී ලංකාවේ යෞවනයන්ගේ ලිංගික චර්යාවන් පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

## (තෝරාගත් ක්ෂේත්‍රයක් ආශ්‍රයෙන්)


| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 808 |
| වර්ග අංකය: | |


නම : කේ. ඒ. සරෝජනී ප්‍රියන්ති
ශිෂ්‍ය අංකය : FGS/S/MSSc/2006/01

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා
ඉදිරිපත් කරන ලදී

2013 පෙබරවාරි 12

# සාරාංශය

පසුගිය දශක කිහිපය තුළ ආසියාවේ සෑම රටකම පාහේ යෞවන සඵලතාව ක්‍රමයෙන් පහළ බසින ප්‍රවණතාවක් වාර්තා කර ඇත. ශ්‍රී ලංකාවේ අවුරුදු 15-19 කාණ්ඩයේ ස්ත්‍රීන් දහසකගේ සඵලතාව 1970 දශකයේදි සජීවී උපත් 38ක් වූ අතර 1990 දශකය වන විට එම අගය සජීවී උපත් 35ක් දක්වා පහත බැස ඇත. වර්ෂ 2000 ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍යය සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ අවුරුදු 15-19 වයස් කාණ්ඩයේ ස්ත්‍රීන් දහසකගේ සඵලතාව සජීවී උපත් 27ක් පමණ වේ. ශ්‍රී ලංකාවේ යෞවන සඵලතාව  පහළ බසින ප්‍රවණතාවක් පෙන්නුම් කළද ගැටලුව වන්නේ පවතින තත්වය තුළ වුව යෞවන මවුවරු සහ පියවරු සම්බන්ධ ගැටලු, ඉතා බරපතල සමාජ ගැටලුවක්  බවට පත්වෙමින් පැවතීමයි.

වර්තමානය වන විට දැරියක් මල්වර වන වයස අඩුවීම හා තරුණියක් විවාහ වීමේ වයස ඉහළ යාමේ ප්‍රතිඵලය වී ඇත්තේ ලිංගික චර්යාවන් සම්බන්ධයෙන් යෞවන යෞවනියන් හට අවදානමක් දැරීමට සිදුවන කාලපරිච්ඡේදයක ජීවත් වීමට සිදුවීමයි. එමෙන්ම යෞවන යෞවනියන් විවාහයට පෙර ලිංගික සබඳතා නිවැරදි අවබෝධයකින් තොරව අනුමත කිරීම තුළ අනපේක්ෂිත ලෙස  ගැබ් ගැනීම, අවජාත දරුවන් බිහි වීම, ගබ්සාවන්ට යොමු වීම, ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග වලට ගොදුරු වීම ආදී ගැටලු වර්තමාන සමාජය තුල වර්ධනය වෙමින් පවතී. එබැවින් මෙම යෞවන ගැටලු කෙරෙහි අවධානය යොමු කිරීම කාලීන අවශ්‍යතාවක් වේ.

මෙවන් පසුබිමක් තුළ ශ්‍රී ලංකාවේ යෞවනයන්ගේ ලිංගික චර්යාවන් පිළිබඳ සමාජ විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම සඳහා පළමු පරිච්ඡේදය යටතේ අදාළ සාහිත්‍ය විමර්ශනය කරමින් පර්යේෂණ ගැටලුව හඳුනාගන්නා ලදී. ඒ අනුව පර්යේෂණ අරමුණු විග්‍රහ කරමින් අධ්‍යයනය කිරීම සඳහා අසම්භාවිතා නියැදි ක්‍රමය අනුව අවශ්‍ය දත්ත රැස්කර ගන්නා ලදී.

දෙවන පරිච්ඡේදය යටතේ වයස අවු: 10-19 අතර අවිවාහක යෞවන යෞවනියන් පිළිබඳව මෙන්ම එම වයස් පරාසයේදී ගැබ් ගැනීමකට හෝ ගබ්සාවකට ලක් වූ අවිවහක යෞවනියන් පිළිබඳ දත්ත විශ්ලේෂණය ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණ, සමාජ ලක්ෂණ, ආර්ථික ලක්ෂණ වශයෙන් පෙන්වා දෙන ලදී.

තෙවන පරිච්ඡේදයෙන් අවු: 10-19 අතර අවිවාහක යෞවන යෞවනියන්ගේ ආදර අත්දැකීම් වල ස්වභාවය, පූර්ව විවාහ ලිංගික චර්යාවන් හා  පූර්ව විවාහ ලිංගික චර්යාවන් වර්ධනය වීමට බලපා ඇති සමාජ සාධක මොනවාද? යන්න පිළිබඳව සාකච්ඡා කර ඇත.

හතරවන පරිච්ඡේදයෙන් අවු: 10-19 අතර අවිවාහක යෞවන යෞවනියන්ගේ හට ප්‍රජනක සෞඛ්‍යයට අදාළව පවතින දැනුම, ස්ත්‍රී ආර්තව ක්‍රියාවලිය පිළිබඳ ඇති දැනුම, ගැබ්ගැනීම මෙන්ම පවුල් සැලසුම් ක්‍රම භාවිතය පිළිබඳ ඇති දැනුම හා ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග පිළිබඳ ඇති දැනුම ආදිය විග්‍රහ කර  ඇත.

පස්වන පරිච්ඡේදයෙන් අවු: 10-19 අතර අවිවාහක යෞවන යෞවනියන් ගැබ් ගැනීමකට හෝ නිතැත් ගබ්සාවකට ලක් වීම නිසා මුහුණ දීමට සිදුවන සමාජීය ආර්ථික, සෞඛ්‍යය ගැටලු මොනවාද? යන්න පිළිබඳව සාකච්ඡා කර ඇත. අවසාන පරිච්ඡේදයෙන් සියලු පරිච්ඡේදයන්ගේ සමාලෝචනය මගින් පැමිණි නිගමනයන් ඉදිරිපත් කර තිබේ.